# <u>සිංහල භාෂාව හා සාහිත්‍යය</u>

## <u>7 - ශ්‍රේණිය</u>

### <u>මාතෘකානුකූලව සාර්ථක වාක්‍ය රචනයක් ලියමු.</u>

කිසියම් සැලසුම් ක්‍රමයකට අනුව තිබිය යුතු ප්‍රබන්ධය රචනයකි .සුදුසු පද සුදුසු තැනට යොදා වාක්‍ය ගැලපීම මෙහිදී අපේක්ෂා කෙරේ. රටාවකට අනුකූලව නිර්මාණශීලි රචනයක් ලිවීම සඳහා අනුගමනය කළ යුතු ආකෘතිය.

- ප්‍රවේශය හෙවත් ආරම්භය.
- මාතෘකානුකූල විනය කරුණු.
- සමාලෝචනය හෙවත් අවසානය.

### <u>රචනයක් ලිවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු</u>

- රචනා මතෘකාවක් තෝරා ගැනීම.
- මාතෘකාව ඔස්සේ කරුණු රැස් කිරීම.
- රචනා සැකිල්ල ගොඩනැගීම.
  - ➢ හැඳින්වීම
  - ➢ ආරම්භය
  - ➢ රචනා ශරීරය (අදාළ කරුණු)
  - ➢ අවසානය
- සුදුසු පරිදි ඡේද වෙන්කර ලිවීම.
- නිර්මාණාත්මක ලෙසත් තර්කානුකූල ලෙසත් කරුණු ඉදිරිපත් කිරීම.

### <u>රචනයක තිබිය යුතු ශිල්පීය උපක්‍රම</u>

- උක්ත ආඛ්‍යාත සම්බන්ධය
- අක්ෂර වින්‍යාසය
- වචන වෙන් කිරීම
- අත් අකුරු

# <u>රචනා සැකිල්ල</u>

**වාක්‍ය රචනය වීම සඳහා සකස් කරගන්නා දළ සටහන සැකිල්ල නම් වේ.**

උදාහරණය (:-)

- වැඩිහිටියන් රැක බලා ගනිමු.
- වැඩිහිටියන් යනු කවුරුන්ද
- වැඩිහිටියන් රැකබලා ගැනීම පිළිබඳ සාකච්ඡා කිරීමට සිදුවීම.
- වැඩිහිටියන්ගේ අගය ඔවුන් සමාජයට සම්පතක් බව.
- වැඩිහිටියන් රැකබලා ගැනීම උදෙසා නිවස තුළ සිදු කළ යුතු කාර්යයන්.
- රජය ගතයුතු ක්‍රියාමාර්ග.
- සමාලෝචනය

# ශ්‍රී ලංකාවේ අහිකුණ්ඨික ජනතාව

ජන කොටස් කිහිපයක් ජීවත්වන අපේ පුංචි ශ්‍රී ලංකාවේ සුවිශේෂී චාරිත්‍ර වාරිත්‍ර ගති ලක්ෂණ පෙන්නුම් කරන ජන කොටසක් ලෙස අහිගුණ්ඨික ජනයා හඳුන්වාදිය හැකිය. ඉන්දියාවෙන් මෙරටට සංක්‍රමණය වන්නට ඇතැයි සැලකෙන මෙම ජන කොට්ඨාසය කණ්ඩායම් වශයෙන් තැනින් තැන සංචාරය කරන, ස්ථිර වාසස්ථානයක් නොමැති සංචාරක ජීවිතයක් ගතකරන ලංකාවේ එකම ජන කොටසයි. වර්තමානයේ පමණක් නොව අතීතයේ පටන්ම ඔවුන්ගේ ජීවන රටාව මෙසේ වූ බව 'චම්පෙය්‍ය ජාතකය' හා 'අහිකුණ්ඨික වත්ථු' කියවීමේදී අපට පැහැදිලි වේ.

උතුරුමැද, සබරගමුව හා නැගෙනහිර පළාත් වලට බහුලව සැරිසරන අතර අනිකුත් ප්‍රදේශ වලද සුළු වශයෙන් සංචාරය කරනු දැකගත හැකිය. 'අහි' යන්නෙන් සර්පයා ද 'ගුණ්ඨික' යන්නෙන් නැටවීම ද අර්ථවත් කෙරෙන අතර 'අහිකුණ්ඨික' යනු 'නයි නටවන්නා' ලෙස පැහැදිලි වේ. ඒ අනුව මොවුන්ගේ ජීවන වෘත්තීන් අනුව ජනයා හඳුන්වන්නට ඇතැයි සිතිය හැක. අහිකුණ්ඨික පිරිමි නයි නැටවීම, රිලවු නැටවීම සිදුකරන අතර ගැහැනු ශාස්ත්‍ර කියමින් ඔවුන්ගේ ජීවිකාව ගෙනයති.

සාමාන්‍ය මිනිසුන්ගෙන් වෙනස් ජීවන රටාවක ් ගත කරන ඔවුන්ගේ තාවකාලික පැල්පත් සකස්කර කර ගන්නේ තල්කොළ වලිනි. එයට හේතු වී ඇත්තේ දින හතකට වඩා එක් ස්ථානයක රැඳී නොසිටින බැවින් ඊළඟ වාසස්ථානය සඳහා ඒවා රැගෙන යාමේ පහසුව සඳහාය. හින්දු ආගම අදහන මොවුන් බුද්ධාගම කෙරෙහි ද විශ්වාසය ඇති බවට පැහැදිලි වන්නේ පොහොය දිනවලදී සතුන් මැරීමෙන් වැළකී සිටින බැවිනි.

විශේෂ සිරිත් විරිත් හා ගති ලක්ෂණ ඇති අහිකුණ්ඨික ජනයාගේ පවුල්වල දැරියන් වැඩිවියට පැමිණීමේ චාරිත්‍රය, විවාහ චාරිත්‍ර, කණ්ඩායම සඳහා නායකයෙකු පත්කර ගැනීම, රැහේ වරදක් කළ කෙනෙකුට දඬුවම් ලබාදීම වැනි අවස්ථා සඳහා ඔවුන් විසින්ම ගොඩනගා ගත් ක්‍රමවේදයක් ඇත.

අපේ රටේ ජීවත් වන සුළු කොටසක් වන මෙම ජනයා 'තෙලුගු' බසින් නිපදවාගත් බස් වහරක් භාවිතා කරන අතර සිංහල හා දෙමළ හැසිරවීමේ හුරුවක් ද ඇත. කෙසේ නමුත් ඔවුන් ව්‍යවහාර කරන භාෂාව පොදු ව්‍යවහාර භාෂාවේ වචන වලට වඩා වෙනස්ය. හිරමනය සඳහා 'හිරමන්' ලෙසද

වංගෙඩිය සඳහා 'රෝලු' වශයෙන්ද පිහිය සඳහා 'මස්කන්' ආදී වචන භාවිතා කරයි.

මොවුන්ගේ ජීවිතවල තවත් විශේෂිත ලක්ෂණයක් වන්නේ යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් හා කිලි දෝෂ පිළිබඳ දැඩි විශ්වාසයයි.

ඉහත දැක්වූ කරුණු අනුව විශේෂිත ජීවන රටාවක් ගෙනයමින් අනාදිමත් කාලයක් පුරා සංචාරක ජීවිතයක් ගතකරන මේ අහිකුණ්ඨික ජනයා උදෙසා වර්තමානය වන විට අනුරාධපුර ප්‍රදේශයේ 'කුඩාගම' නමින් ගම්මානයක් ඉදිකර තිබීම සුබදායක කටයුත්තක් ලෙස අප අගය කළ යුතුය. මේ පුංචි ශ්‍රී ලංකාවේ තවත් එක් ජන කොටසක් වන මොවුන්ට ද අනෙකුත් ජනයාට මෙන් ස්ථිර වාසස්ථානයක්, ක්‍රමවත් අධ්‍යාපනයක්, පිළිගත් ජීවන වෘත්තියක නියැලෙමින් ජීවත් වන්නට අවස්ථාවක් උදා වේ නම් එය රටේ ආර්ථික, සමාජ, සංස්කෘතික සංවර්ධනයට බෙහෙවින් ඉවහල් වනු ඇත.

# මා දුටු සීගිරිය

"පවිටු අඳුරු මිනිසැකු සේ
නොකර අනිටු දේ රිසි සේ
මනරම් දේ සිත් අගි සේ
ලියා තියයි නුඹ රහසේ "

(සීගිරි අභිනික්මන - 2006)

ප්‍රෞඪ ඉතිහාසයකට නෑකම් කියන අපේ සිංහල දේශීය පාරම්පරික උරුමයක් ලෙසින් ලෝක ප්‍රකට වූ සීගිරිය මා දුටු සුන්දරම දර්ශනතල අතුරින් එකකි. අපේ රටට අනන්‍ය වූ ඓතිහාසික සලකුණක් ලෙසින් සුවිශේෂ වූ සීගිරිය පර්වතය දෙස කුමන කෝණයකින් බැලුවද දක්නට ලැබෙන සුන්දරත්වය මනස්කාන්තය. එය වචනයකට පරිවර්තනය කර පැවසීමට තරම් මා සතු වචන ශබ්දකෝෂය නොපොහොසත්යැ'යි මට හැඟෙයි.

සිංහල දේශයේ පිත් මහිමයට ලද අභිමානනීය පියමංතලාවක් වන සීගිරිය සිංහල චිත්‍ර කලාවේ ද, වාස්තු විද්‍යා හා ගෘහ නිර්මාණ ශිල්පයෙන් ද සමන්විත ලොව අටවන පුදුමය ලෙස හඳුන්වයි. සීගිරිය සැබැවින්ම මහා කලාගාරය වංශකතා වලට අනුව සීගිරි කතා පුවත ගොඩනැගෙනුයේ සීගිරි නිර්මාතෘ වූ දුක්බර අවසානයකට බඳුන් වන පළමු වන කාශ්‍යප රජු වටාය. සැබැවින්ම මෙය හතරවන ශතවර්ෂයට අයත් පුරාණ රජ වාසලකි. රජ මාළිගයක් මෙන්ම බලකොටුවක් ලෙසටද භාවිතාකළ ස්ථානයක් ලෙස සීගිරිය හඳුන්වාදිය හැකිය. හෙළ කලාකරුවන් සතු විශ්මිත නිර්මාණ චාතුර්ය විදහා දැක්වීමේ සාක්ෂි අදටත් සීගිරි පරිශ්‍රයේ දක්නට ලැබේ.

තැනිතලාවේ සිට අඩි 600 ක් පමණ ඉහළට නැගී සිටින සීගිරි පර්වතය දිගින් 3km ක් ද පළලින් 1km පමණ වන අතර සීගිරිය මුදුනේ විශාලත්වය අක්කර 3ක පමණ ප්‍රමාණයකි. ක්‍රි:ව 5 සියවස අවසන ඉදි වූවායැ'යි ගිණිය හැකි ගල් හා ගඩොල් සම්ශ්‍රිත අතිශෝභමාන ගෘහ නිර්මාණ සංකීර්ණය දුටුවන්ගේ නෙත් වලට ගෙනෙන්නේ විශ්මයකි. මහා පවුරු, දිය අගල්, ආරක්ෂක කුටි, ස්වාභාවික ගල් ආරුක්කු ආදියෙනුත් මල් උයන් මෙන්ම හිරි ගලින් නිමැවුණු සියුම්ව පිරිමැද මටසිළුටු කළ කැඩපත් පවුර යන නම්ලද මහා පවුරෙන් සමන්විත වූ මෙම වංකගිරියේ තේජෝ බලපරාක්‍රමය කෙලෙස නම් විස්තර කරම්ද?

මල් රැගෙන පිදුරංගල වන්දනාවට යන ස්වර්ණ වර්ණ හා නීලවර්ණ කතුන්ගේ ලලනා රූපයන්ගෙන් සැදුම්ලත් බිතුසිතුවමෙහි සුන්දරත්වය නෙත්හි මනස්කාන්ත දසුන් මවයි. සුන්දරය, ගුප්තය සීගිරිය සැබැවින්ම සිත තුළ ආනන්දයක් මතුකරන දුර සිට දුටුවිටදී පවා දෙනෙත් වලට රසඳුන් මවන සීගිරිය තවත් සියවස් දහස් ගණනක් පවතීවා. එහි සුන්දරත්වය රැකෙන පරිදි ආරක්ෂාකර මතු පරපුරටද පැවරීම ඔබේත් මගේත් සැබෑම යුතුකමයි.

# සාරධර්ම සුරකිමු

සමාජයේ යහපත් පුද්ගලයකු ලෙස ජීවත්වීමට නම් කුඩා කාලයේ සිටම සාරධර්ම පිළිපැදිය යුතු ම ය. එනම් යහගුණයෙන් යුතුව වාසය කළ යුතු බවයි. යහගුණයෙන් පිරිපුන් මිනිසුන්ගේ සමාජයට කිසි කලෙකත් අවැඩක් සිදු නොවේ. ඔවුන් කරන්නේ යහපතක්මය. මිනිසුන්ට පමණක් නොව සතුන්, ගහකොළ වල ඇතුළු සමස්ත පරිසරයට ඔවුහු ආදරය කරති. සහයෝගය, සහජීවනය, එකිනෙකා කෙරෙහි දක්වන ගෞරවය, නිහතමානීකම අගයන මොවුන් සමාජ අභිවෘද්ධිය උදෙසා පරාර්ථකාමී ලෙස කටයුතු කරන්නෝ වෙති.

ඕනෑම රටක යහපැවැත්ම උදෙසා සදාචාරසම්පන්න ප්‍රජාවක් සිටීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා සියලු ආගමික නායකයින් මිනිසාට සමාජය තුළ හැසිරිය යුතු ආකාරය පිළිබඳ සම්මත වූ නීති රැසක් පෙන්වා දී තිබේ. මේවා තුළින් එකිනෙකාට ගරු කරමින් භක්තියෙන් යුක්තව ධර්මානුකූලව ජීවිකාව ගෙන යා යුතු ආකාරය මනාව පැහැදිලි කර ඇත. එවැනි සමාජයක් තුළ අන්‍යන් අතර සුහඳතාව, සහයෝගය ගොඩනැගෙන්නේ නිරායාසයෙනි. එහි ප්‍රතිඵලය වන්නේ විවිධ වූ පුද්ගලයන් වෙසෙන සමාජයක වුව ද ජාති භේද, ආගම් භේද, කුල බේද නොමැති මානව හිතවාදී පුරවැසියන් ලෙස ජීවත් වීමට හැකිවීමයි.

සාරධර්ම නැතහොත් යහගුණයන් ලෙස අපට හඳුනාගත හැක්කේ විනයගරුක බව, සත්‍ය ගරුක වීම, ඉවසීම, අන්‍ය මතවලට ගරුකිරීම, නිහතමානීකම, ත්‍යාගශීලී බව මෙන්ම පරාර්ථකාමී වීම ආදී ගුණධර්මයන් ය. මෙවැනි යහගුණ වලින් හෙබි පුද්ගලයන් සෑම විටම සමාජ සම්මතයන්ට පටහැනි නොවන ක්‍රියාවන්හි පමණක් නියැලේ. ඔවුන් සෑම විටම යුක්තිගරුක, නීතිගරුක පුද්ගලයෝ වෙති, එවැනි මිනිසුන්ගෙන් පිරි සමාජයක් සෑම විටම අභිවෘද්ධිය කරාම යොමුවෙයි.

වර්තමාන සමාජ රාමුව තුළ මෙම සාරධර්ම සුරැකීම කෙරෙහි දක්වන නොසැලකිලිමත් බව නිසාවෙන් පැනනැගී ඇති ගැටලු බොහෝමයකි. එහි ප්‍රතිඵලය වී ඇත්තේ එකිනෙකා අතර වෛරය, ඊර්ෂ්‍යාව, කුහකකම වැනි දුර්ගුණ ඉස්මතු වී සමස්ත සමාජයම පිරිහීමට පත්වීමයි. නොදැනුවත්කම, නොසැලකිලිමත් බව සහ තරඟකාරී ජීවන රටාවේ අහිතකර බලපෑම තුළ මිනිසාට සාරධර්ම සංකල්පය මඟහැරී ගොස් ඇත. එය සමාජය සීඝ්‍රයෙන් පරිහානියට පත් කිරීමට අද වනවිට සමත් වී ඇත. සිරගෙවල්, වැඩිහිටි නිවාස,

පුනරුත්ථාපන කඳවුරු දිනෙන් දින වැඩි වීම, මානසික පීඩනය, ළමා අපචාර හා අපයෝජන, දික්කසාද වන සංඛ්‍යාව දිනෙන් දින ඉහළ යාම වැනි සෑම තත්වයක් කෙරෙහිම හේතු වී ඇත්තේ අතීතයේ අප විසින් සුරැකි පුරුදු අද වන විට මග හැරී යාමය.

එබැවින් සමාජය පිරිහීමට ලක් නොවී රටක් සංවර්ධනය කරා යොමුවීම සඳහා සමාජයේ පවත්නා කුඩාම ඒකකය වන පවුල තුළින් සමාජ සාරධර්ම ආරක්ෂා කිරීමෙන්, පිළිපැදීමෙන් ගම, නගරය, රට තුළ පමණක් නොව මුළු ලෝකයේම අභිවෘද්ධිය උදෙසා සාරධර්ම මහෝපකාරී වන බැවින් ඒ උතුම් හර පද්ධතීන් රැක ගැනීම අප සැමගේම යුතුකමකි.

# කියවීමේ අගය

"මිනිසා සිටින්නේ ශාස්ත්‍ර නම් තටාකයේ ගිලී මිය යන්නට නොව ශාස්ත්‍ර නම් සයුරේ ගිලී මුතු ගෙන ඒමටයි" උක්ත පාඨයෙන් කියවෙන්නේ පොතපත කියවීමේ වටිනාකම පිළිබඳවයි.එය මහත්මා ගාන්ධි තුමාගේ ප්‍රකාශයකි.මිනිසා යනු, ඕනෑම දෙයක් සාර්ථකව ඉටුකරගත හැකි මොළයක් මෙන්ම බුද්ධි කදම්භයක් ඇති ජීවී කොට්ඨාසයකි.

වත්මන් සමාජයේ පොතට ඇලුම් කරන්නේ කවුරුන්ද? පොතක ඇති අගය පිළිබඳව යමෙකුගෙන් විමසුවහොත් කෙබඳු පිළිතුරක් ලැබේදැයි සිතීමත් උගහටය.වත්මන් සමාජය තුළ පොත් කියවීම සඳහා පාඨක රුචිකත්වය ඉතා අවමය. නමුදු,එය විනෝදාංශයක් කරගත් පිරිස්ද නැතුවාම නොවේ. සැබැවින්ම පොතක් කියවීම වනාහි භාවනාවකට සමවැදීමක් හා සමානය.මනස නිරවුල් වූ විට අප කියවන දේවල් නිවැරදිව ග්‍රහණය කරගත හැකි වන අතර චිත්ත ඒකාග්‍රතාවක් නොමැති වූ කල කොපමණ පොත් සංඛ්‍යාවක් කියවුවද කිසිදු කරුණුක් මතක්යේ නොරැඳෙයි. එබැවින් ඔබ කිසිම විටෙක කාලය අපතේ නොයවන්න.ලද හැකි සෑම විටම පොතක් ගෙන කියවන්න. රූපවාහිනිය, අන්තර්ජාලය, ජංගම දුරකථනය අභිමුව ඔබේ වටිනා කාලය බිලි නොදෙන්න.සෑම නිමේෂයක්ම ඵලදායියැ'යි හැඟෙන අයුරින් ගත කරන්න. පොත්පත් කියවීමට ඔබ තුළම ස්වයං උත්ප්‍රේරණයක් ඇති කරගන්න.පොතක් කියවීම තුළින් ඔබට ලබාගත හැකි වරප්‍රසාද එමටය. දැනුම, ආකල්ප, කුසලතා පූරණය මගින් ඔබේ දිවිය ආලෝකමත් කරගන්න. එයම ජීවිතයට පන්නරයක් කර එමගින් ඔබ ඔබවම දකින්න . ඔබ ඔබවම නිර්මාණය කරගන්න. ඔබ තුළින් අනෙක් අයට ද ආදර්ශයක් මතුකර පෙන්වීමට ක්‍රියා කරන්න.

"කියවීම් මිනිසා සම්පූර්ණ කරයි"

ඔබ තුළින් පරිපූර්ණ මිනිසෙකු ඉස්මතුකර ලෝකයාට පෙන්වන්න. පොත පතට ආදරය කරන්න. පොත මිතුරකු කරගන්න. "පොත නුඹ හොඳයි මිතුරන් දහසකට වඩා" නිරන්තරයෙන් පොත පත පරිශීලනය කිරීමත් පොතම කල්‍යාණ මිතුරෙකු බවට පත්කර ගැනීමත් ඔබ පරිපූර්ණ මිනිසකු බවට පත්කරනු ඇත.

# වන අසිරිය විඳිමු

නෙක තුරු ගොමුවලින්, වන සිවුපාවුන්ගෙන්, සුවඳ මලින්, ඉඳුනිල් මිණි පැහැගත් සිසිල් දිය දහරාවන්ගෙන් පමණක් නොව කිංකිණි හඬින් රාව ප්‍රතිරාව නගන සියොතුන්ගෙන් අලංකාර වූ වනාන්තරය ඇසූ දුටු කොයි කාගේත් නෙත් සිත් ප්‍රබෝධවත් කරන්නකි.එය සොබාදහමේ අපූර්ව නිර්මාණයකි. කාලාන්තරයක් තිස්සේ ඒ ඒ ප්‍රදේශවලට අනුවර්තනය වෙමින් ලොකු කුඩා ශාක විශාල ප්‍රමාණයක එකතුවකින් සැදුම්ලත් මේ රමණීය භූමි භාගයන් අපා,දෙපා, සිවුපා, හා බහුපා නොයෙකුත් සත්වයන් ගෙන් සමන්විත වූ රාජධානියකි. චිත්තාකර්ෂණීය වූ නිසංසල පරිසරයකි.මිහිපිට අපට ලැබුණු සොඳුරුතම දායාදයකි.

කඳුවැටි අතරින් රෑරා එන එමින්, රශ්මි දහරා විහිදුවමින් පෙරදිග අහසෙන් නැග එන හිරු කුමරුගේ ආලෝක කදම්බයන් තුරු හිස් මුදුනේ සෙමින් පතිත වෙමින් හිරුගේ තේජස විදහාපාන්නේ වන දෙව්ලියට ආශිර්වාදයක් මෙනි. මෙවන් සොඳුරු දසුනක් විඳීමට තරම් අපිද බිඳ භාග්‍යවන්තයෝ වෙමු

ඉම්හිරි මල් සුවඳින් හා නේක වර්ණ වෘක්ෂලතාදීන්ගෙන් සැදුම් ලත් මේ චමත්කාරජනක වනයෙහි හටගත් මිහිරි ඵලවල රසය විඳිමින් ගසින් ගසට පැන යන, ගසින් ගසට ඉගිලී යන සත්වයෝ පමණක් නොව තුරු සෙවණෙහි පහස ලබමින් වන පියසේ ඇවිද යන ලොකු කුඩා සෑම සත්වයෙක්ම එහි උරුමකරුවෝය. ජලජ ජීවීන් ගෙන් හා පැළෑටි පමණක් නොව මහා ගංගාවන්ගේ පෝෂණයට උරදෙන වැසි දෙවියන්ගේද ආශිර්වාදය,පහස ලබමින් මේ වන කොමළිය දිනෙන් දින සොබාමත් වේ.

වියවුල් මනසින්, පීඩාකාරී හැඟීම් වලින් චංචල වූ ඕනෑම පුද්ගලයකුට මේ නිසංසල වන අරණ සිත නිවි පහන් කිරීමේ අපූරු බලයක් ඇත.නමුත් අද බොහෝ දෙනෙකු මේ අගනා දායාදයෙහි වටිනාකම නොදනිති. එය ආරක්ෂා කිරීමේ අදිටනක් ඔවුන් තුළ නැත. කෙටිකාලීන ලාභ ප්‍රයෝජන උදෙසා මේ වටිනා සම්පත් සීග්‍රයෙන් විනාශ කිරීම්ට පෙළඹී ඇත. එය ඔබගේත් මගේත් පමණක් නොව අනාගත දරු පරපුරේම අභාග්‍යයකි. ඉන් සිදුවන්නා වූ අහිතකර ප්‍රතිඵලයන්ගේ බියකරු බව කොතෙක්දැයි මිල කළ නොහැකිය.

එසේනම් මේ මනස්කාන්ත වන රජදහන ආරක්ෂා කිරීම අප සැමගේ යුතුකමකි. එමෙන්ම වගකීමකි.සොබාදහමින් ලැබුණු මේ දායාදය අපගේ සිත් සතන් කුල්මත් කරමින් ගතේ විඩාව නිවා සංසිඳුවමින් වැජඹෙනවා පමණක් නොව සියලු සත්වයන් ගේ වාසභූමියකි. එහි සුන්දරත්වය මෙන්ම ඉන් ලැබෙන ඵල ප්‍රයෝජන කෙරෙහි සෑම මොහොතකම අප සිහිපත් කළ යුතුය.

චිත්තාකර්ෂණීය වූ  දර්ශනීය වූ දායාදයන්ගේ පහස විඳිමින් එහි මිල කළ නොහැකි අගය වටහා ගනිමින් ඉදිරි පරම්පරා ගණනාවක්ද මෙහි උරුමක්කාරයෝය යන හැඟීමෙන් යුක්තව අද අපි මේ වනයෙහි අසිරිය විඳිමු. එය සොබාදහම අපි ආරක්ෂා කිරීමෙන් සොබාදහම විසින් අපව ද නිරායාසයෙන්ම ආරක්ෂා කිරීමකි .

- පැවරුම් : පෙළ පොතේ (113) පිටුවේ  ලිඛිත අභ්‍යාස කරන්න.